දැදිගම්පුර
කලා පුනිචා



පළාත්‌ීය ලේකම් කාර්යාලීය ප්‍රකාශනයකි

කලාව යනු මානව ජීවිතය හා බැඳී අතිශය සෞන්දර්යාත්මක ප්‍රවේශයකි. ඒ සෞන්දර්යාත්මක රස විඳිනය සමාජයක ශිෂ්ඨබව හා ගුණධර්ම පිළිඹිබු වන තවත් කැඩපතක් වේ. ඕනෑම කලාවක අරමුණ මිනිස් සිත්සතන්වල සංවේදී බව ඇති කරමින් සොඳා දහමට ලැදි සහකම්පනයෙන් යුත් මානව ප්‍රජාවක් බිහි කිරීමයි. එවැනි සංස්කෘතික මිනිසුන් බිහි කිරීම උදෙසා තම දිවිය කැපකරමින් ලේඛනය, නර්තනය, නාට්‍ය හා රංග කලාව , කවිය, චිත්‍ර, මූර්ති කැටයම් හා අංගම්පොර ආදී විවිධ ක්ෂේත්‍රවලින් තම විශිෂ්ඨ නිර්මාණ ජාතියට දායද කළ හෙළ කලා ශිල්පීන් රැසක් වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් බිහි වීම අපේ සාඩම්බරයට කරුණකි. එහිදී දැදිගම්පුරවරයෙන් ජන්මය ලද පරාක්‍රමබාහු නිරිඳානන්ගේ සිට දේශීය නර්තන කලාව දෙස් විදෙස් දේශයන්ගේ සුපතල කළ අල්ගම පණිහාරත කලාකරුවා වැනි සකලවිධ කලාවන් අප කොට්ඨාසයේ අභිමානීය ඉතිහාසයට එක් කළ සියලු කලාශිල්පීන් ඉතා ගෞරවයෙන් සිහිපත් කරන්නෙමු.

වරකාපොල කොට්ඨාසයෙන් බිහි වූ එවැනි ප්‍රවීන මෙන්ම නවක
කලා ශිල්පීන් විධිමත්ව හඳුනාගනිමින් ඔවුන්ගේ
හැකියාවන් හා අනන්‍යතාවය අගයමින් එය මතුපරපුරට
සම්ප්‍රේෂණය කිරීම පහසු කිරීම හුදෙක් මම
සමාජ සත්කාරයක් ලෙස ද දකිමි. එහි පළමු අදියර
මෙලෙස සාර්ථකව නිමා කරමින් ප්‍රදේශයේ දක්ෂ
විසිරි සිටින කලාකරුවන් හතළිස් හත්දෙනකුගේ තොරතුරු
ඇතුළත් කරමින් මේ විද්‍යුත් ග්‍රන්ථය සකස් කොට ඇති අතර ඉදිරියේදී හඳුනා ගැනෙන
තවත් කලාකරුවන්ගේ තොරතුරුවලින් මෙය යාවත්කාලීන කිරීම අපේ අරමුණ වේ.
තවද මෙමඟින් දෙස් විදෙස් රටවල ජනතාවට මේ කලාකරුවන් හා පහසුවෙන්
සම්බන්ධ වීමට හැකි වීම සුවිශේෂී කරුණකි.
එහිදී ඔවුනොවුන් අතර ඇති දුරස්ථබව අඩු කර වරකාපොල ප්‍රදේශයට සාඩම්බර
අභිමානයක් මෙන්ම ඔවුනොවුන්ගේ පුද්ගලික
අපේක්ෂාවන් හා දියුණුව සාක්ෂාත් කර ගැනීමට 'දැදිගම්පුර කලා ප්‍රතිභා' විද්‍යුත්
ග්‍රන්ථය හැකි වනු ඇතැයි මම උදෙක් විශ්වාස කරමි.

එ.එම්. රංගන සජීව
ප්‍රාදේශීය ලේකම්,
වරකාපොල
2025.03.26

පෙළගැස්ම

01 ටී. පී. ජී. පියරත්න
02 යූ.ආර්. චන්ද්‍රානි සුදුමැණිකේ
03 ඩබ්. එම්. අයි. පී. විජේසූරිය
04 ජී. ආර්. මියුරි ඇලන් අබේරත්න
05 නිමල් ගුණසේකර
06 පී. වජිරා චාන්දනී
07 එස් .කරුණාරත්න
08 කේ. ඒ. ජයන්ත සරත් විජේරත්න
09 එස්. එම්. ප්‍රියංගනී කුමාරි විජේරත්න,
10 කේ. ටී. එන්. ඩබ්. ඒ. ආර්. ඩී. එස්. අබේකෝන්
11 විනිතා කුමුදිනී නාවුල්ලගේ
12 දිලිප් මනෝලාල් පීරිස් සමරක්කොඩි
13 එච් .පී. එස්. සුනිල් ජයරත්න
14 ආර්. එම්. ආනන්ද රාජපක්ෂ
15 එච්. පී. සිරිසෝම
16 ජී. කුසුම් පැලවත්ත
17 බී. කුමුදිනී මානෙල්
18 ජී. පී. රාණි ශ්‍රියාලතා (රාණි එස්. ගලහිටියාව)
19 කේ. පී. තිඹිරපාල ජයවර්ධන
20 ජේ. එම්. තුසිත කුමාර ජයසුන්දර
21 එස්. කේ. ප්‍රේමා කන්දේගම
22 අයි. ආර්. පොඩිනිලමේ
23 ජී. ඩී. ස්වර්ණලතා තිලකරත්න
24 එච්. ඒ. ටී. ධර්මසිරි හෙට්ටිආරච්චි
25 යසස් ශ්‍රී වානක කරුණාරත්න
26 පී. එන්. දුලංජලී මදුෂිකා ජයතිලක
27 ඊ. ඒ . ශ්‍රියා ගනේගොඩ
28 ජී. ඒ. රත්නවර්ධන ගනේගොඩ
29 එස්. ජී. එස්. රාජපක්ෂ
30 කේ. ඒ. ප්‍රියන්ති රේණුකා
31 ඒ. ප්‍රියංගා කුමුදුනී සෝමරත්න
32 වයි.පී. දිනුෂා මධුවන්ති ආරියරත්න
33 යූ. පී. අයෝධ්‍යා ශ්‍යාමි කුමාරි උඩුගම
34 ඩබ්. ඒ. රුවන් සංජීව
35 ඩබ්. බී. එන්. ජී. නිශානි ප්‍රියංකා
36 ඩබ්. බී. එන්. නන්දෝරස්
37 ජේ. පී. සිරිසේන
38 ඩබ්. ඩී. චාන්දනී ජයනෙත්ති
39 එම්. ඒ. අශෝකා චාන්දනී මදුරුසිංහ
40 පී. කේ. සසිකා විනෝදනී සුහසිංහ
41 ආර්. එම්. විරාජ් ලංකා රාජපක්ෂ
42 ආර්.එම්. මනෝජ් ලංකා රාජපක්ෂ
43 එච්. ඒ. සුචිනිතා
44 ජී. ලසන්ත සොමිරුවන් ප්‍රේමචන්ද්‍ර
45 එම්. රණසිංහ
46 ආර්. එම්. සුනිල් විජේතුංග
47 ජී. ෂම්මි රොෂාන් මාලින්ද,

ටී. පී. ජී. පියරත්න

විජයබා හෙළකලා සම්මේලනය,
කැන්දගොල්ල, කෝදාපාලුව, අලව්ව
උපන් දිනය 1958.09.04
දු. අං. 0716663945

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ අලව්ව කෝදාපාලුව ගම් පියසේ උපන් තෙලිකඩ පල්ලිය ගුරුන්නාන්සේලාගේ පියරත්න කලාකරු ලෙව්කේ පරපුරට අයත් සිව්කෝරළ හරඹ කලාවේ උරුමකරුය. වෙනිවැල්කඩුව කනිටු විදුහලෙන් හා රාහුල ජාතික පාසලින් පාසල් අධ්‍යාපනය ලබා ඇත. සටන් කලා උපදේශකවරයෙකු වන ඔහු කෙටිසුගෝ හරඹ කලාවේ කරාතේ, සමාතේ ,ජුදෝ, අයිකිදෝ ප්‍රගුණ කර ඇත. ජ්‍යෝතිෂ්‍ය-වේදියෙකු වශයෙන් කටයුතුකරන ඔහු කරාතේ ජාතික පුහුණු කරුවෙකු මෙන්ම විනිසුරුවර යෙක්ද වේ. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් පිරිනමන කලාභූෂණ රාජ්‍ය සම්මාන යෙන් ද සබරගමු පළාත් ලලිත කලාපති හා ප්‍රතිභාප්‍රණාම සම්මානවලින් ද පිදුම් ලබා ඇත. එමෙන්ම කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලයෙන් පිරිනමන මහ දිසාපති අභිනන්දන හා කලාවිභාෂි සම්මානවලින් මෙන්ම වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිරිනමන දැදිගම්පුර අභිමානි සම්මානයෙන්ද පිදුම් ලබා ඇත. දැනට ඔහු තම දක්ෂතා හා හැකියාවන් අනාගත පරපුරට දායාද කර දෙමින් සිටී.

යූ.ආර්. චන්ද්‍රානි සුදුමැණිකේ

ශෂික,
එකමුතු මාවත, තුල්හිරිය.
උපන් දිනය 1959.06.01
දු.අං- 0714408186

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ තුල්හිරිය ගම්පියසේ උපන් උඩගෙදර රාළලාගේ චන්ද්‍රානි සුදුමැණිකේ කලාකාරිනිය තුල්හිරිය මහා විද්‍යාලයෙන් හා ගලපිටමඩ වළගම්බා මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යාපනවේදී උපාධිය හදාරා ඇති ඇය වෘත්තියෙන් රජයේ පාසල් ගුරුවරියක් ලෙස පාසල් ගණනාවක සේවය කර ඇත. පාසල් දරුවන් හට කලාප, පළාත් හා ජාතික මට්ටමින් ජයග්‍රහණ රැසක් අත්කර දීමට කටයුතු කළ ඇය ජාතික හා ජාත්‍යයන්තර වශයෙන් ජයග්‍රහණ රැසක් හිමි කරගෙන තිබේ. ජාත්‍යයන්තර කාන්තා දිනයේදී චිත්‍ර කලාව වෙනුවෙන් කළ සේවය අගයමින් සහ බිතු සිතුවම් කළ ප්‍රථම කාන්තාව වෙනුවෙන් දිරිය කාන්තා ජාතික සම්මානයට ද ඇය පාත්‍ර වී ඇත. වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පිරිනමන දැදිගම්පුර කලා ප්‍රසාදිනී සම්මානයෙන් සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් පිරිනමන කලාභූෂණ රාජ්‍ය සම්මානයෙන්ද (2023) පිදුම් ලබා තිබේ. චන්ද්‍රානි චිත්‍ර මූර්ති කලායතනයේ කලායත නාධිපතිනිය වන ඇය ඒ හරහාද තම දැනුම දුදරුවන් වෙත ලබා දෙමින් සිටී.

ඩබ්. එම්. අයි. ජී. විජේසූරිය

"ශෂික" එකමුතු මාවත,තුල්හිරිය.
උපන් දිනය- 1955.07.28
දු. අං. 0714407963

මධ්‍යම පළතේ මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කණ්ඩලම ගම්පියසේ උපන් වර්ණකුලසූරිය මුදියන්සේලාගේ ඉහළ ගෙදර විජේසූරිය කලාකරු දඹුල්ල මධ්‍ය මහා විද්‍යාලයෙන් හා කණ්ඩලම තෙන්නකෝන් මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. දැදිගම්පුර කවි සමාජයේ පද්‍ය රචනා සහ හිටිවන කවියෙකි. පැල්වෙහෙර කෘෂිකර්ම විද්‍යාලයේ ඩිප්ලෝමාව සහ වැලිසර සත්ත්ව පාලන විද්‍යාලයේ ඩිප්ලෝමාව හදාරා ඇති මේ කලාකරුවා විශ්‍රාමික පශු සම්පත් සංවර්ධන නිලධාරියෙකු වේ.

ජී. ආර්. මියුරි ඇලන් අබේරත්න

"ඉනෝකාළ",
ධර්මසිරි සේනානායක මාවත,
වරකාපොල.
උපන් දිනය - 1954.07.10

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ ඒබඩගල ගම්පියසේ උපන් ගල්ලත් රාළලාගේ මියුරි ඇලන් අබේරත්න නම් කලාකාරිනිය ගලපිටමඩ වළගම්බා මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. පෙරදිග සංගීතය හා නර්තනය පිළිබඳ සහනිකපත් විභාගයෙන් සමත්ව භාත්කණ්ඩේ සංගීත විද්‍යාපීඨයේ ලක්නව් විශාරද උපාධි පාඨමාලාව හදාරා ඇති ඇය පාසල් සංගීත ගුරුවරියක් ලෙසින් දිවයිනේ පාසල් ගණනාවක සේවය කර ඇත. සෑම වසරකම සංගීත අංශයෙන් කලාප, පළාත් හා ජාතික මට්ටමින් පාසල් දරුවන්ට ජයග්‍රහණ රැසක් අත්කර දීමට කටයුතු කර ඇත. අද විශ්‍රාමික සුවයෙන් පසුවන මේ කලාකාරිනිය සංගීතය වෙනුවෙන් කළ සේවය අගයමින් සබරගමුව පළාත් සභාවෙන් පිරිනමන ලලිත කලාපති ගෞරව සම්මානයෙන් ද සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් පිරිනමන කලාභූෂණ රාජ්‍ය සම්මානයෙන් ද 2018 වසරේ පුරවැසි ලංකා පදනම විසින් පිරිනමන ලද ශ්‍රී විභූෂණ විශ්ව කීර්ති ජනාභිනන්දන සම්මානයෙන්ද පිදුම් ලබා ඇති ඇය අද සෙව්වන්දි කලායතනයේ කලායතනාධිපති වශයෙන් කටයුතු කරයි.

නිමල් ගුණසේකර

අඹේපුස්ස, වරකාපොල.
උපන්දිනය 1948.07.15
දු. අං. 0729652414

සබරගමුව පළාතේ කැගල්ල දිස්ත්‍රික්කයේ අඹේපුස්ස ගම් පියසේ උපන් නිමල් ගුණසේකර කලාකරු සංගීත අධ්‍යක්ෂණය, ගායනය, තනු නිර්මාණය සහ ගීත රචනයේ නියලෙන ගුවන්විදුලි ඒ ශ්‍රේණියේ ගායකයෙක් වන අතර වෘත්තියෙන් ද ගායකයෙකි. පාසල් ගුරුවරයකු වශයෙන්ද ඔහු කටයුතු කර ඇත. සංගීත ක්ෂේත්‍රයට අදාළව කෘති කිහිපයක්ද රචනා කර ඇති මේ කලාකරු කුරුණෑගල මලිය දේව විද්‍යාලයෙන් හා රඹුක්කන හේවාදිවෙල විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. ඔහු ජාතික තලයේ සහ ආධුනික ගායික ගායිකාවන් සඳහා ගීත රැසක් රචනා කර තිබේ. 'ආවාට තිබුණත් නිසසල සඳු මත', 'නංගිලාට වාසි බෝ වගේ' වැනි ගීත රාශියක් මොහු විසින් ගායනා කරයි. සංගීත ක්ෂේත්‍රයට අදාළව මියැසි මඟ, සාහිත්‍ය හා සංගීතය, ගුවන්විදුලියෙන් නොඇසූ රස කතා, භාෂාව හරහා ගොඩ නැගෙන සංගීතය ආදී වටිනා කෘති රැසක් රචනා කර ඇත. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් පිරිනමන කලාභූෂණ රාජ්‍ය සම්මානයෙන්ද සබරගමු පළාත් සභාවෙන් පිරිනමන ප්‍රතිභා ප්‍රණාම සම්මානයෙන්ද පිදුම් ලබා ඇති ඔහු ලලිතකලාපති (විශේෂ) සම්මානයෙන් ද පිදුම් ලබා ඇත.

පී. වජිරා චාන්දනී

යසස් ශ්‍රී කලායතනය,මැදගම, අල්ගම.
උපන් දිනය - 1962.03.02
දු. අං.0763910065
0755036557

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ගම්පියසේ උපත ලද පිම්මච්චාරිගේ වජිරා චාන්දනී නම් කලාකාරිනිය ගම්පහ සියනෑ කෝරළයේ පාරම්පරික සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය (නර්තනය) කලාභූෂණ සම්මානලාභී පී. කමල් රත්නසිරි මහතාගේ දියණියයි. කුඩා කල සිටම සිය පියා යටතේ නර්තනය , ගායනය, වාදනය ආදී කලා ක්ෂේත්‍රවල නියැලුණු ඇය ගම්පහ රත්නාවලි බාලිකා විද්‍යාලයෙන් හා ගම්පහ බණ්ඩාරනායක මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. කැළණිය විශ්වවිද්‍යාලයෙන් සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධිය ද නාවල විවෘත විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව ද හදාරා ඇති ඇය රජයේ පාසල් ගුරුවරියක්ද, ගුරු උපදේශිකාවක් ලෙසින්ද වසර ගණනාවක් කටයුතු කර ඇති අතර අද විශ්‍රාමිකව පසු වේ. කලාවට ලබා දී ඇති විශිෂ්ඨ සේවය අගයමින් මහනුවර ශ්‍රී සිද්ධාර්ථ බෞද්ධ සංස්කෘතික පදනමින් පිරිනමන දේශගෞරව දිරියමාතා කීර්ති විද්‍යාජෝති සමාජධර ගෞරව නාමයෙන් හා කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් පිරිනමන කලා විභාෂි (2024) අභිනන්දන සම්මානයෙන් ද පිදුම් ලබා ඇති ඇය අල්ගම පණිහාරත පරම්පරාවේ සාමාජිකයකු වන පාරම්පරික ජ්‍යෝතිෂ ශාස්ත්‍රයේ හා යන්ත්‍ර මන්ත්‍ර කලාවේ නියැලී සිටින එස්. කරුණාරත්න මහතා සමඟ විවාහ වී සිටියි. ජාතික නැටුම් සංගීත විභාගය ද සමත් වී ඇති ඇය යසස් ශ්‍රී කලායතනයේ සංගීත ආචාර්යවරිය හා කලායතනාධිපතිනිය ලෙසද කටයුතු කරයි . මේ කලාකාරිනිය තම කලායතන සිසුන්ට සබරගමු පළාත් අන්තර් කලායතන තරඟ ජයග්‍රහණ රැසක් අත්කර දීමට කටයුතු කර ඇත.

එස් .කරුණාරත්න

යසස් ශ්‍රී කලායතනය,
මැදගම, අල්ගම.
උපන් දිනය - 1957.06.29
දු. අං. 076391004

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ අල්ගම නම් ගම්පියසේ උපන් සිත්තත්චාරිගේ කරුණාරත්න කලාකරු අල්ගම පාරම්පරික නර්තන ආචාර්ය පණිභාරත කලා පරපුරෙන් පැවත එන සාමාජිකයකු වන අතර ජ්‍යෝතිෂ ශාස්ත්‍රය හා යන්ත්‍ර මන්ත්‍ර කලාව මනාව ප්‍රගුණ කල අයෙකි. කෑ/වර/ අල්ගම මධ්‍ය මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. කෑගල්ල දිස්ත්‍රික්කයේ හෙළ ජන ශාන්තිකර්මවේදීන්ගේ සංවිධානයේ අනුශාසන ධූරය දරන ඔහු සබරගමු පළාත් සභාවේ ලලිත කලාපති සම්මානයෙන්ද ශ්‍රී සිද්ධාර්ථ බෞද්ධ සහයෝගිතා පදනමින් පිරිනමන දේශගෞරව කීර්ති දේශාභිමානි කලාවිශාරද කීර්ති ශ්‍රී කලාශූර ගෞරව නාමයෙන්ගෙන් ද පිදුම් ලබා ඇත. ඔහුගේ බිරිඳ අල්ගම යසස් ශ්‍රී කලායතනයේ කලාධිපතිනිය ලෙස කටයුතු කරන පී. වසිරා චාන්දනී නම් කලාකාරිනියයි.



කේ. ඒ. ජයන්ත සරත් විජේරත්න

මහවත්ත.මැදගම.අල්ගම.
ගුරු ගෙදර.නුවර පාර.වරකාපොල.
උපන් දිනය-1953.06.20
දු. අං. 0769864811

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ වරකාපොල ගම්පියසේ උපන් කුරුප්පු අප්පුහාමිලාගේ ජයන්ත සරත් විජේරත්න කලාකරු වෘත්තියෙන් විශ්‍රාමික සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගණිතය පිළිබඳ අධ්‍යාපන අධ්‍යක්ෂකවරයෙකි. තෝලංගමුව මධ්‍ය මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලැබූ ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ ගණිතය පිළිබඳ බිප්ලෝමාධාරියෙක් මෙන්ම ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපනවේදී උපාධිදරයෙකි. කලක් එදිරිවීර සරච්චන්දයන්ගේ මනමේ වේදිකා නාට්‍යයේ වැදී දෙටුවාගේ චරිතය රඟ දැක්වූයේ ඔහුය. ජනප්‍රිය වේදිකා නාට්‍ය රැසක රංගනයෙන්, ගායනයෙන් හා පසුතල නිර්මාණයට දායක වී ඇති ඔහු කෘති රැසක් රචනා කළ ප්‍රවීන ලේඛකයෙකි. ජනප්‍රිය කවියෙකි. වේදිකා හා ගුවන් විදුලි නාට්‍ය රචකයකි. ශ්‍රී ලංකාවේ පළමු වරට පාසල් පද්ධතියට ගණිත නාට්‍ය හඳුන්වාදීමේ ගෞරවය හිමිවන්නේ ඔහුටය. බ්‍රිතාන්‍ය තාරකා විද්‍යා සංගමයේ සාමාජිකයෙකු වන ඔහු කෑගල්ල තාරකා විද්‍යා මධ්‍යස්ථානයේ උපදේශකවරයෙකු ලෙසද කටයුතු කරයි. වරකාපොල කලාකරුවන්ට තෝතැන්නක් වූ මානස වල නම් වළිමහන් රංග පීඨයේ නිර්මාතෘ මේ කලාකරු වේ. සබරගමු පළාත් සාහිත්‍ය කලා මහෝත්සවයේදී කලාවට සිදු කළ අනුපමේය සේවය අගයමින් විශිෂ්ඨ කලාකරුවන්ට පිරිනමන විශේෂ සම්මානයකින් ද වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පිරි නමන දැදිගම්පුර කලා ප්‍රසාදිනි සම්මානයෙන්ද ඔහු පිදුම් ලබා ඇත.

එස්. එම්. ප්‍රියංගනී කුමාරි විජේරත්න

ගුරු ගෙදර,නුවර පාර,වරකාපොල.
උපන් දිනය- 1965.03.19
දු. අං. 0767919626

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල කොට්ඨාසයේ නිට්ටඹුව කිත්තම්මහර ගම්පිය-සේ උපන් සෙනරත් මුදලිගේ ප්‍රියංගනී කුමාරි විජේරත්න කලාකාරිනිය වෘත්තියෙන් ගණිත ගුරුවරියකි ගම්/අත්/කිත්තම්හර මහා විද්‍යාලයෙන් හා නිට්ටඹුව සංඝබෝධි මධ්‍ය මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලැබූ ඇය ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිදාරිනියකි. ප්‍රවීන ලේඛිකාවක් , නිදහස් මාධ්‍යවේදිනියක් මෙන්ම ජනප්‍රිය ගීත රචිකාවියක් ලෙස කටයුතු කරන ඇය ගුවන් විදුලි වැඩසටහන් සම්පාදනය කිරීමේ නිරත වී සිටියි. මේ කලාකාරිනියගේ කවි, ගීත, කෙටිකතා, සාහිත්‍ය විචාර හා ළමා කතාන්දර වසර ගණනාවක සිට රාජ්‍ය සාහිත්‍ය මහෝත්සවයේ ජයග්‍රහණ ලබමින් ඇගයීමට ලක් වී ඇත. දශක කිහිපයක සිට ලේඛන කලාවේ නිරත වී සිටින ඇය සබරගමු පළාත් සාහිත්‍ය කලා මහෝත්සවයේ කලාවට ලබා දී ඇති අනුපමේය සේවය අගයමින් විශිෂ්ඨ කලාකරුවන්ට පිරිනමන විශේෂ සම්මානයකින්ද ඇගයීමට පාත්‍ර වී තිබේ. වැස්සක් වෙලා ඔබ එන්න, මලක් වෙන්න පෙරුම් පුරන, සතුටක් නෑ දියණියේ ගීත ගුවන් විදුලියේ ප්‍රචාරය වන ඇයගේ ජනප්‍රි ගීත රචනා වේ.

කේ.ටී.එන්.ඩබ්.ඒ.ආර්.ඩී.එස්. අබේකෝන්

අලව්ව පාර,
නෙළුන්දෙනිය.
උපන් දිනය - 1963.10.10
දු. අං.- 0717260112

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලිගමුව කොට්ඨාසයේ වට්ටාරම ගම්පියසේ උපන් කෙන්පිටි තෙලගපාත නවරත්න වාසල අබේකෝන් මුදියන්සේ රාලහාමිලාගේ දිපා ශ්‍රියානි අබේකෝන් කලාකාරිනිය නර්තනය සම්බන්ධ විශ්‍රාමික පාසල් ගුරුවරියකි. කෑ/ගලි/ වලගම මහා විද්‍යාලයෙන් ඇය පාසල් අධ්‍යාපනය ලබා ඇත. වර්තමානය වන විට ඇය සංඛ කලායතනයේ කලායතනාධිපති නියවශයෙන් කටයුතු කරයි . දැයේ දු දරුවන්ට ප්‍රාදේශිය , දිස්ත්‍රික් පළාත් සහ සමස්ත ලංකා ජයග්‍රහණ රැසක් අත්කර දීමට ද ඇය කටයුතු කර ඇත.

විනිතා කුමුදිනි නාවුල්ලගේ

38/ඒ, පැරණි රෝහල් පාර, වරකාපොල.
උපන් දිනය 1962.07.27
දු. අං. 0711000682

සබරගමුව පළාතේ කැගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ වරකාපොල ගම්පියසේ උපන් විනිතා කුමුදුනි නාවුල්ලගේ කලාකාරිනිය විශ්‍රාමික උපාධිධාරී රජයේ පාසල් ගුරුවරියකි. කුරුණෑගල මලියදේව බාලිකා විද්‍යාලයෙන් හා තෝලංගමුව මධ්‍ය මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යාපනවේදී උපාධිධාරිනියක් වන ඇය ජාතික නැටුම් සංගීත තරඟ විභාගය ද සමත් වී තිබේ. වසර හතළිහකට ආසන්න කාලයක් තිස්සේ දැයේ දුදරුවන්ට නර්තනය උගන්වන අතර සෑම වසරකම පාහේ කොට්ඨාස, කලාප හා සමස්ත ලංකා ජයග්‍රහණ රැසක් අත්කර දී තිබේ. සබරගමුව පළාත් සභාව විසින් පිරිනමන ලලිතකලාපති සම්මාන යෙන්ද ඇගයීමට පාත්‍ර වී ඇති ඇය රංගධාර කලා කේන්ද්‍රයේ කලායතනාධිපතිනිය ලෙස කටයුතු කරයි.

දිලිප් මනෝලාල් පීරිස් සමරක්කොඩි

38ඒ, පැරණි රෝහල පාර,
වරකාපොල
උපන් දිනය- 1955.12.10
දු. අංක- 0714398306
0779966417

බස්නාහිර පළාතේ කලුතර දිස්ත්‍රික්කයේ හොරණ කොට්ඨාසයේ හඳපාන්ගොඩ ගම්පියසේ උපන් දිලිප් මනෝලාල් පීරිස් සමරක්කොඩි කලාකරු සදැස් කාව්‍යකරණයේ නියලෙන්නෙකි. හොරණ හඳපාන්ගොඩ කණිෂ්ඨ විද්‍යාලයෙන් හා හොරණ තක්ෂිලා මධ්‍ය මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. වෘත්තියෙන් විශ්‍රාමික මහජන සෞඛ්‍ය පරීක්ෂකයකු වන ඔහු කැළණිය විශ්වවිද්‍යාලයේ ප්‍රජා සෞඛ්‍ය ඩිප්ලෝමාධාරියෙකි. 2022 වසරේ සිට මේ දක්වා ප්‍රාදේශීය , දිස්ත්‍රික් සාහිත්‍ය තරඟයෙන් සදැස් කාව්‍යවලට අදාළ ජයග්‍රහණ රැසක් හිමිකරගෙන ඇත. කැළණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පිරිනමන කාව්‍යදීප සම්මානයෙන්ද ඇගයීමට ලක්ව තිබේ.

එච් .පී. එස්. සුනිල් ජයරත්න

යෝධම් ගෙදර, දොරවක.
උපන් දිනය 1938.04.18
දු.අං. 071789951

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ දොරවක ගම්පියසේ උපන් හේවා පතිරණසිංහ සුනිල් ජයරත්න කලාකරු දොරවක සිරිනිවාස විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. වෘත්තියෙන් ගුරුවරයකු වන ඔහු ලේඛන කලාව, චිත්‍ර කලාව, විසිතුරු භාණ්ඩ නිර්මාණය හා සැරසිලි කලාවේ නියැලී සිටියි. පාරම්පරික විෂ වෛද්‍යවරයකු මෙන්ම ජ්‍යෝතිෂ්‍යවේදියෙකු වශයෙන් ද මේ කලාකරු කටයුතු කරයි. ප්‍රාදේශීය , දිස්ත්‍රික් හා පළාත් සාහිත්‍ය තරොඟවලින් ජයග්‍රහණ රැසක් හිමිකරගෙන ඇති ඔහු සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් පිරිනමන කලාභූෂණ රාජ්‍ය සම්මානයෙන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පිරිනමන දැදිගම්පුර කලා ප්‍රසාදිනී සම්මානයෙන්ද පිදුම් ලබා තිබේ.

ආර්. එම්. ආනන්ද රාජපක්ෂ

මහවත්ත, මැදගම,
අල්ගම.
උපන් දිනය 1960.08.10
දු.අං. 0779681514
0759681514

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ අල්ගම ගම්පියසේ උපන් රාජපක්ෂ මුදියන්සේලාගේ ආනන්ද රාජකරුණා කලාකරු අල්ගම මධ්‍ය මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. ජාතික නැටුම්, සංගීත විභාගයෙන් සමත් ව සමාධි කලායතනාධිපති වශයෙන් කටයුතු කරන මේ කලාකරුවා කලායතන සිසුන්ට ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා පළාත් මට්ටමේ ජයග්‍රහණ රැසක් අත්කරදීමට කටයුතු කර ඇත. සබරගමුව පළාත් සභාවේ ප්‍රතිභා ප්‍රණාම සම්මාන යෙන් ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිරිනමන දැදිගම්පුර කලා ප්‍රසාදිනී සම්මානයෙන්ද පිදුම් ලබා ඇති ඔහු නර්තන ක්ෂේත්‍රයට අදාළව අනාගත දරු පරපුර වෙනුවෙන් මහත් සේවයක් ඉටුකරමින් සිටින දක්ෂ කලාකරුවෙකි.

එච්. පී. සිරිසෝම

පල්ලේබාගේ, දොරවක.
උපන් දිනය 1964.01.29
දු. අං. 0776337771

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අටුගොඩ ගම්පියසේ උපන් හේරත් පතිරණගේ ප්‍රියරංග සිරිසෝම කලාකරු අටුගොඩ ශ්‍රී සුමංගල මධ්‍ය මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. ජාතික නැටුම් සංගීත විභාගයෙන් සමත්ව තිබේ. කලාව වෙනුවෙන් ඔහු කළ සේවය අගයමින් වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් පිරිනමන දැදිගම්පුර කලා ප්‍රසාදිනී සම්මා-නයෙන් හා සබරගමු පළාත් සභාවෙන් පිරිනමන ප්‍රතිභා ප්‍රණාම සම්මානයෙන් ඇගයීමට ලක් වී ඇත. දොරවක සුලලිත කලායතනයේ කලායතනාධිපති වශයෙන් කටයුතු කරන මේ කලාකරු වසර තිහකට අධික කාලයක් තිස්සේ දු දරුවන්ට නර්තනය උගන්වන අතර ජයග්‍රහණ රැසක් අත්කර දීමට කටයුතු කර තිබේ.

ජී. කුසුම් පැලවත්ත
94/බී,නිවටුව.
උපන් දිනය- 1957.10.12
දු. අං. 0714427601

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ ගලපිටමඩ ගම්පියසේ උපන් ගමනායකගේ කුසුම් පැලවත්ත කලාකාරිනිය සම්මනලාහි ලේඛිකාවකි. කෙටි කතා, ළමා කතා, සාහිත්‍ය විචාර, ගී පද රචනා මෙන්ම පර්යේෂණ නිබන්ධන රැසක් රචනා කර ඇත. කෑ/වර/නිවටුව මහා විද්‍යාලයෙන් කො/ සිතාවක මධ්‍ය මහා විද්‍යාලයෙන් හා කෑ/වර/ ගලපිටමඩ වළගම්බා මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය හදාරා ඇති ඇය විශ්‍රාමික පාසල් ගුරුවරියකි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද හදාරා ඇති ඇය නියෝජ්‍ය විදුහල්පතිනියක් ලෙසද රාජකාරි කටයුතු කර ඇත. වසර ගණනාවක සිට ගුවන්විදුලියට හා පුවත්පත්වලට නිර්මාණ සැපයු නිදහස් මාධ්‍යවේදිනියක් ලෙස ද කටයුතු කරන මේ කලාකාරිනිය සිය සාහිත්‍යය නිර්මාණ සඳහා ප්‍රාදේශීය ,දිස්ත්‍රික් සහ පළාත් මට්ටමේ ජයග්‍රහණ රැසක් හිමි කර ගෙන ඇත. සුදු සහ කලු , මුතු මාලය , පරපුටුවාගේ කතාව හා රන් දම්වැල් ළමා කතාව ඇය විසින් රචිත ජනප්‍රිය ළමා කතා වේ.

බී. කුමුදිනී මානෙල්
නො. 117/15,
කොළඹ පාර,අලව්ව.
උපන් දිනය-1973.04.04
දු. අං. 0713363314

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අලව්ව ගම්පියසේ උපන් බටුවනයලාගේ කුමුදිනී මානෙල් කලාකාරිනිය අලව්ව රතනාලංකාර මහා විද්‍යාලයෙන් හා පොල්ගහවෙල ශාන්ත බර්නාදෙත් මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. පශ්චාත් අධ්‍යාපන ඩිප්ලෝමාධාරී නර්තන ගුරුවරිය-ක් වන ඇය සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ ලලිත කලාවේදී උපාධිධාරිනියකි. දැදිගම්පුර කලා ප්‍රසාදිනි සම්මානයෙන් ඇගයුම් ලබා ඇත. අලව්ව සුලලිත කලායතනයේ කලායතනාධිපතිනිය ලෙස කටයුතු කරන ඇය දැයේ දු දරුවන්ට නර්තනය උගන්වමින් ජයග්‍රහණ රැසක් අත්කර දීමට කටයුතු කර තිබේ.

ජී. ජී. රාණි ශ්‍රියාලතා (රාණි එස්. ගලහිටියාව)

යහලදෙනිය.රංවල, බෙලිඟල.
උපන්දිනය 1960.11.26
දු.අං- 0711006041

උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය කොට්ඨාසයේ යාල එක ගම්පියසේ උපන්බිම වූ ගලහිටියාව ගෙදර රාණි ශ්‍රියාලතා කලාකාරිනිය හිටිවන කවි හා ලේඛන කලාවේ නියලෙන කලාකාරිනියකි. පොළොන්නරුව මැදිරිගිරිය බිසෝබණ්ඩාර කණිෂ්ඨ විද්‍යාලයෙන් හා මැදිරිගිරිය ජාතික පාසලෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. වෘත්තියෙන් පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙන ඇය 2013 වසරේ සමස්ත ලංකා ජාතික කවි සම්මේලනයේ හා 2018 වසරේ දේශීය කෘෂි සම්පත් හා තම්මැන්නා කවි සම්මේලනයෙන් සම්මාන ලබා තිබේ. ප්‍රාදේශීය සාහිත්‍ය තරඟවලින් ජයග්‍රහණ රැසක් ලබා ඇති ඇය 2011 වසරේ වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පිරිනැමූ සිය කලා මෙහෙවර උදෙසා වූ දැදිගම්පුර කලා ප්‍රසාදිනි සම්මානයෙන් පිදුම් ලබා ඇත. හඳ බැඳි සිතුවිලි කාව්‍ය සංග්‍රහය එදාමෙදාතුර නවකතාව සෙනහසේ උරුමය කෙටිකතා සංග්‍රහය ඇය විසින් රචිත නිර්මාණ වේ.

කේ. පී. නිෂිරපාල ජයවර්ධන,

ජී156/3/පී,
බටපොතැල්ල,
නෙළුන්දෙනිය.
දු. අං. 0716194383

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ නෙලුන්දෙනිය ගම්පියසේ උපන් කොවියන්ගොඩ පතිරැන්නැහැලාගේ තුෂිරපාල ජයවර්ධන කලාකරු පහතරට නැටුම් හා බෙර වාදන ශිල්පියෙකි. ජාතික තරුණසේවා සභාවෙන් ලලිතකලාවේදී ඩිප්ලෝමාව හදාරා ඇත. 1993 සිට 2006 දක්වා කෑගල්ල ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලයේ දේශීය තූර්ය වාදක කණ්ඩායම් පුහුණුකරු-වකු ලෙස කටයුතු කර ඇති ඔහු එම පාසලේම සමස්ත ලංකා නර්තන හා බෙරවාදන තරඟ ජයග්‍රහණ සඳහා ද දායකත්වය ලබා දී ඇති ඔහු අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් පිරිනමන ලද යක් බෙර ඝෝෂක සම්මානයෙන් ද ඇගයීමට ලක් වී ඇත.

ජේ. එම්. තුසිත කුමාර ජයසුන්දර

රාගල අලව්ව.
උපන් දිනය- 1982.01.13
දු. අං. 0713088367

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ රාගල ගම්පියසේ උපන් තුසිත කුමාර ජයසුන්ද කලාකරු පාරම්පරික උඩරට නර්තන හා බෙර වාදන ශිල්පියෙකි. කෑ/වර/ කහඹිලියාවල මහා විද්‍යාලයෙන් හා කෑ/වර/තුල්හිරිය මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. ජාතික නැටුම් සංගීත විභාගය සමත් වී ඇති ඔහු රාගල්කන්ද රණමයුර කලායතනයේ ආචාර්යවරයෙකු ලෙස කටයුතු කරයි.

එස්. කේ. ප්‍රේමා කන්දේගම,

හදිකා, කුඩාඔය පාර,
වරකාපොල.
උපන් දිනය -1943.03.01
දු.අං. 07185823777

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ කන්දේගම ගම්පියසේ උපන් සමරික් කොඩිගේ ප්‍රේමා කන්දේගම කලාකාරිනිය දක්ෂ නර්තනන ශිල්පිනියකි. වෘත්තියෙන් විශ්‍රාමික ගුරුවරියක් මෙන්ම ජ්‍යෙෂ්ඨ කට්කාචාර්යවරියක් වන ඇය පාසල් දු දැරියන් රැසකට නර්තන අංශයෙන් සමස්තලංකා ජයග්‍රහණ ලබා දීමට කටයුතු කර තිබේ. 2014 වසරේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් පිරිනමන කලාභූෂණ රාජ්‍ය සම්මානයෙන් ද පිදුම් ලබා ඇත.

අයි. ආර්. පොඩි නිලමේ,

අලව්ව පාර , මොරවක.
උපන් දිනය - 1959.12.16
දු.අං. 03522882452
0761698235

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ නෙළුන්දෙනිය මොරවක ගම්පියසේ උපන් ඉම්රාළලාගේ පොඩි නිලමේ කලාකරු මොරවක කණිෂ්ඨ විද්‍යාලයෙන් හා නාපේ සීලානන්දන පිරිවෙනින් අධ්‍යාපනය ලබා ඇත. හිටිවන කවි , කෙටිකතා හා නාට්‍ය පිටපත් රචකයෙකි. ඔහු දහම් පාසල් හා ළමා සමාජ සමඟ සම්බන්ධ වී වත්මන් දරු පරපුර වෙනුවෙන් අනුපමේය සේවයක් ඉටු කරමින් සිටියි.

පී. ඩී. ස්වර්ණලතා තිලකරත්න

මෙනේරිපිටිය,
වරකාපොල.
උපන් දිනය 1971.12.03
දු.අං. 0712647389

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ මෙනේරිපිටිය ගම්පියසේ උපන් පුලිහංගපුර දේවගේ ස්වර්ණලතා තිලකරත්න කලාකාරිනිය කෑ/වර/ ගාමිණී මහා විද්‍යාලයෙන් හා තෝලංගමුව මධ්‍ය මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ ලලිතකලාවේදී උපාධිධාරිනියක් වන මේ කලාකාරිනිය වෘත්තියෙන් රජයේ පාසල් ගුරුවරියකි. ජාතික නැටුම් සංගීත විභාගය සමත් වී ඇති ඇය උඩරට පහතරට අවසාන විභාගයද සමත් වී ඇත. මෙනේරිපිටිය ශ්‍රීමාලි කලායතනයේ කලායතනාධිපතිනිය ලෙස කටයුතු කරන ඇය දැයේ දු දරුවන්ට ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා පළාත් නර්තන තරඟවලින් ජයග්‍රහණ රැසක් ලබා දීමට කටයුතු කර ඇත.

එච්. ඒ. ටී. ධර්මසිරි හෙට්ටිආරච්චි

"ධර්මසිරි හොටෝ"
ඕපාත, අලව්ව.
උපන් දිනය-1960.01.28
දු.අං. 0718569784
0372279040

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ අලව්ව ගම්පියසේ උපන් හෙට්ටිආරච්චි තෙනැත්නැහැලාගේ ධර්මසිරි හෙට්ටිආරච්චි කලාකරු ඡායාරූප හා වීඩියෝකරණයේ නියලෙන්නෙකි. කෑ/ කහඹිලියාවල මහා විද්‍යාලයෙන් හා අලව්ව ජාතික පාසලෙන් අධ්‍යාපනය ලබා ඇත. ඡායාරූපකරණය පිළිබඳ පාඨමාලා රැසක් හදාරා ඇති ඔහු දේවාලේගම සංස්කෘතික මධ්‍යස්ථානයේ හා මාහේන අධ්‍යාපන කාර්යාලයේ නොවිඳිමත් අධ්‍යාපනය යටතේ ඡායාරූපකරණය පිළිබඳ උපදේශකවරයෙකු ලෙස ද කටයුතු කර ඇත.

යසස් ශ්‍රී චානක කරුණාරත්න

යසස් ශ්‍රී කලායතනය,මැදගම,අල්ගම.
උපන් දිනය 1991. 05.30
දු. අං. 0772158508
0758007610

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ අල්ගම ගම්පියසේ උපන් සිත්‍රත්‍රාචාර්ගේ යසස් ශ්‍රී චානක කරුණාරත්න කලාකරු අල්ගම පාරම්පරික නර්තන ආචාර්ය පණිහාරත කලා පරම්පරාවෙන් පැවත එන සාමාජිකයෙක් වන අතර විපිරා චාන්දනී නම් කලාකාරිනියගේ හා පාරම්පරික ජ්‍යෝතිෂ්‍යවේදී කරුණාරත්න මහතාගේ පුතණුවන්ය. ගම්/ එල්ලක්ල මහා විද්‍යාලයෙන් හා ගම්/බණ්ඩාරනායක මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයෙන් ප්‍රාසාංගික කලාවේදී උපාධිය ලබා ඇත. වෘත්තියෙන් ගුරුවරයෙකු වන අතර සමස්ත ලංකා හා සබරගමු පළාත් අන්තර් කලායතන තරඟවලින් ජයග්‍රහණ රැසක් දිනා තිබේ. මානව හිතවාදී කලා විභූෂණ කීර්ති ශ්‍රී දේශ ගෞරව ලංකා පුත්‍ර ගෞරව නාමයෙන් පිදුම් ලබා තිබේ. අල්ගම යසස් ශ්‍රී කලායතනයේ ආචාර්යවරයෙකු ලෙස කටයුතු කරයි.

පී. එන්. දුලංජලී මදුෂිකා ජයතිලක,

යසස් ශ්‍රී කලා විද්‍යායතනය,මැදගම, අල්ගම.
උපන් දිනය 1994. 01.17
දු.අං. 0750978508
0774978508

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අලව්ව ගම්පියසේ උපන් පංච නාදයලාගේ දුලංජලී මදුෂිකා ජයතිලක කලාකාරිනිය පංචනාද පරම්පරාවෙන් පැවත එන නර්තන ශිල්පිනියකි. අල්ගම පාරම්පරික නර්තන ආචාර්ය පණිභාරත පරම්පරාවේ සාමාජිකයකු වන යසස් ශ්‍රී චානක කරුණාරත්න කලාකරුවා සමඟ විවාහ වී සිටියි. අලව්ව ශ්‍රී රාහුල මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රසංග කලා විශේෂවේදී උපාධිය ලබා ඇති ඇය වෘත්තියෙන් රජයේ පාසල් ගුරුවරියකි. පාසල් සමස්ත ලංකා ජයග්‍රහණ රැසක් දිනා ඇති මේ කලාකාරිනිය දේශාභිමානී , කීර්ති ශ්‍රී කලා විභාරද සමාජ අභිනන්දන ගෞරව නාමයෙන්ද පිදුම් ලබා තිබේ.

ඊ. ඒ . ශ්‍රියා ගනේගොඩ

සකුරා, මදුරුපිටිය , අල්ගම.
උපන් දිනය 1956.10.14
දු. අං- 0789199012

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මණ්ඩාවල ගම්පියසේ උපන් ශ්‍රියා ගනේගොඩ කලාකාරිනිය ගම්පහ දෙකටන පද්මාවති විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. ඇය ජ්‍යෝතිෂ්‍ය කලාවේ මෙන්ම හිටිවන කවි හා ලේඛන කලාවේ නියලෙන කලාකාරිනියකි. ප්‍රාදේශීය සාහිත්‍යයේ තරඟ ජයග්‍රහණ රැසක් ලබා ඇත. ජ්‍යෝතිෂ විෂයට අදාළව ඉරහඳ පුවත්පතට ලිපි සපයන අතර සිළුමිණ ජාතික පුවත්පතේ නිදහස් මාධ්‍යවේදිනියක් ද වශයෙන් කටයුතු කරයි. සෙනෙහසේ නවාතැන සහ සෙනෙහෙ විල ඇය විසින් රචිත කාව්‍ය කෘති දෙකකි.

ජී. ඒ. රත්නවර්ධන ගනේගොඩ,

සකුරා, මදුරුපිටිය,අල්ගම.
උපන් දිනය 1954.07.04
දු. අං.- 0332284987
0710510233

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ අල්ගම ගම්පියසේ උපන් ජී. ඒ. රත්නවර්ධන ගනේගොඩ කලාකරු අල්ගම මහා විද්‍යාලයෙන් හා නාපේ පිරිවෙනින් අධ්‍යාපනය ලබා ඇත. විශ්‍රාමික පිස්කල් නිලධාරියකු වන ඔහු ගොක්කොළ කලාවේ හා කැටයම් කලාවේ නියලී සිටින දක්ෂ කලාකරුවෙකි. ඕනෑම උත්සව අවස්ථාවකට උචිත ලෙස ගොක්කොළ කලාවෙන් නව නිර්මාණ හැකියාවන් එළිදැක්වීමට සමත්ව සිටී.

එස්. ජී. එස්. රාජපක්ෂ

මාලිගාතැන්න, නාංගල්ල තුල්හිරිය.
උපන් දිනය -1943.03.18
දු. අං. 0711951733

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ බෝයවලාන ගම්පියසේ උපන් සෙනරත් ගමගේ සෝමා රාජපක්ෂ කලාකාරිනිය විශ්‍රාමික නර්තන ගුරුවරියකි. බෝයවලාන මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. ජාතික නැටුම් සංගීත විභාගයෙන් සමත්ව ඇති මේ කලාකාරිනිය වසර හතලිහකට ආසන්න කාලයක් තිස්සේ දුදරුවන්ගේ නර්තන හැකියාවන් ප්‍රගුණ කරමින් ජයග්‍රහණ රැසක් අත්කර දීමට කටයුතු කර තිබේ. වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පිරිනමන දැදිගම්පුර කලා ප්‍රසාදිනි සම්මානයෙන්ද සබරගමුව පළාත් සභාවෙන් පිරිනමන ප්‍රතිභා ප්‍රණාම සම්මානයෙන් ද සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් පිරිනමන කලාභූෂණ රාජ්‍ය සම්මානයෙන්ද පිදුම් ලබා ඇත. වර්තමානය වන විට ඇය නාංගල්ල ප්‍රභාෂ්වර කලායතනයේ කලායතනාධිපතිනිය වශයෙන් කටයුතු කරනු ලබයි.

කේ. ඒ. ප්‍රියන්ති රේණුකා

ඩී163/2බී.නුවර පාර,තෝලංගමුව.
උපන් දිනය 1969.03.30
දු. අං. 0775208458/ 0711923688

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ තෙලි ඇල්ල ගම්පියසේ උපන් කන්දෙ අප්පුහාමිල්ලාගේ ප්‍රියන්ති රේණුකා කලාකාරිනිය සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ ලලිතකලාවේදී උපාධිධාරිනියකි. මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාලාධාරිනියක් වන මේ කලාකාරිනිය 2009 වසරේ සිට 2024 දක්වා කෑගල්ල අධ්‍යාපන කලාපයේ ගුරු උපදේශිකා-වක ලෙසද කටයුතු කර ඇත. තෝලංගමුව මධ්‍ය මහා විද්‍යාලයේ සහකාර විදුහල්පතිනිය ලෙසද කටයුතු කරන ඇයට චිත්‍ර විෂය පිළිබඳව ඇත්තේ හසළ දැනුමකි. ඒ දැනුම පාසල් දු දරුවන්ට ලබා දෙමින් කලාප, පළාත් හා සමස්ත ලංකා ජයග්‍රහණ රැසක් අත්කරදීමටද ඇය කටයුතු කර ඇත.

ඒ. ප්‍රියංගා කුමුදුනී සෝමරත්න

ඉහළගම්මැද්ද, දැදිගම, නෙලුන්දෙනිය.
උපන් දිනය -1976.11.18
දු.අං. 0714827693

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලිගමුව කොට්ඨාසයේ කෝට්ටපොල ගම්පියසේ උපන් අලුත්ගේ ප්‍රියංගා කුමුදුනී සෝමරත්න කලාකාරිනිය චිත්‍ර විෂය සම්බන්ධ පුද්ගලික පාසල් ගුරුවරියකි. කෝට්ටපොල හැටහින්න කණිෂ්ඨ විද්‍යාලයෙන් හා කෑගල බාලිකා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. හෙළින්දෙනිය තරුමල් කලායතනයේ කලායතනාධිපතිනිය වන ඇය චිත්‍ර කලාව පිළිබඳ දැනුම දු දරුවන්ට ලබා දෙමින් කොට්ඨාස, කලාප හා සමස්ත ලංකා ජයග්‍රහණ රැසක් අත්කර දීමට කටයුතු කර ඇත.

වයි.පී. දිනුෂා මධුවන්ති ආරියරත්න

'චන්දනී' හඳුන්ගොඩ, දොරවක
වරකාපොල,
උපන් දිනය 1992.10.10
දු. අං. 0707180815

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ දොරවක ගම්පියසේ උපන් යසරත්න පතිරණගේ දිනුෂා මධුවන්ති ආරියරත්න කලාකාරිනිය ගුවන්විදුලි ඒ ශ්‍රේණියේ සරළ ගී ගායිකාවකි. කෑ/ ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇති අතර සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයෙන් ප්‍රසාංගික කලා විශේෂවේදී උපාධිය ලබා ඇත. ගායන හා වාදන ක්ෂේත්‍රයන්හි විශේෂ දස්කම් දක්වන ඇය හාත්බණ්ඩේ සංගීත විශාරද උපාධියද ලබා ඇති අතර සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය සංගීත කණ්ඩායමේ සාමාජිකාවක ලෙසද කටයුතු කර ඇත. "පුද කරන්නට ප්‍රේමයක්" ගීතය මේ කලාකාරිනියගේ ප්‍රථම ගීත නිර්මාණයයි. වර්තමානය වන විට ඇය සංවර්ධන නිලධාරිනියක් ලෙස කටයුතු කරමින් සිටී.

යූ. ජී. අයෝධ්‍යා ශ්‍යාමි කුමාරි උඩුගම

මංගෙදර, තුල්හිරිය.
උපන් දිනය- 1993.12.03
දු. අං. 0779897774

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ මහපල්ලේගම උපන් උඩුගමයලාගේ අයෝධ්‍යා ශ්‍යාමි කුමාරි උඩුගම කලාකාරිනිය කෑ/ දැදිගම පැරකුම්බා මහා විද්‍යාල යෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. ඇය කැළණිය විශ්වවිද්‍යාලයේ ප්‍රසංගකලා විශේෂවේදී උපාධි ධාරිනියක් වන අතර හාත්බණ්ඩේ සංගීත විශාරද උපාධියද ලබා ඇත. ගායනයෙන්, වාදනයෙන් විශේෂ දස්කම් දක්වන මේ කලාකාරිනිය වර්තමානය වන විට සංවර්ධන නිලධාරිනියක් ලෙස කටයුතු කරමින් සිටී.

ඩබ්. ඒ. රුවන් සංජීව

සී/56/2ඒ, හුණුවල, තුල්හිරිය.
උපන් දිනය- 1981.11.18
දු.අං. 0701304066

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වීරකැටිය කොට්ඨාසයේ වීරකැටිය ගම්පියසේ උපන් වික්‍රමසිංහ ආරච්චිගේ රුවන් සංජීව කලාකරු නිවේදන හා කාව්‍යකරණයේ නියලෙයි. හම්බන්තොට මොරයාය මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. කැළණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන විශේෂවේදී ගෞරව උපාධිධාරියකු වන ඔහු වෘත්තියෙන් ආර්ථික සංවර්ධන නිලධාරියෙකි. "රුවා" නමින් ඔහුගේ කුඳුල් කාව්‍ය නිර්මාණ ග්‍රන්ථය එළි දක්වා ඇත

ඩබ්. බී. එන්. ජී. නිශානි ප්‍රියංකා

ඇත්නාවල ඉහළ, නිවටුව.
උපන් දිනය - 1976.06.09
දු.අං. 0767686984
0767684875

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කෝට්ඨාසයේ නිවටුව ගම්පියසේ උපන් වෛද්‍යරත්න බණ්ඩාර නෙලුම් ගමගේ නිශානි ප්‍රියංකා විමලවීර කලාකාරිනිය පාරම්පරික නර්තන හා ගායන ශිල්පිනියකි. කෑ/වර/ නිවටුව මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇති ඇය ජාතික නැටුම් සංගීත විභාගයෙන් සමත් වී ඇත. ඇය දිස්ත්‍රික් මට්ටමේ ජයග්‍රහණ රැසක් ද හිමි කරගැනීමට සමත් වී තිබේ.

ඩබ්. බී. එන්. නන්දෝරිස්

ඇත්නාවල ඉහළ,
නිවටුව.
උපන් දිනය- 1942.06.02
දු. අං. 0773796859

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ රුවන්වැල්ල කෝට්ඨාසයේ නිවුන්හැල්ල ගම්පියසේ උපන් වේදවෛද්‍ය බ්‍රහ්මවිචාරී නැකතිගේ නන්දෝරිස් කලාකරු දක්ෂ නර්තන ශිල්පියෙකි. ඉහළ තල්දුව කණිෂ්ඨ විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇති ඔහු 2016 වසරේ කලාභූෂණ රාජ්‍ය සම්මානයෙන්ද 2013 වසරේ සබරගමු පළාත් ප්‍රතිභා ප්‍රණාම සම්මානයෙන්ද 2011 වසරේ කලා ප්‍රසාදිනි සම්මානයෙන් හා 2006 වසරේ සාහිත්‍ය කලා සම්මානයෙන්ද පිදුම් ලබා ඇත.

පේ. පී. සිරිසේන

දොරවක,උඩුමුල්ල,
ගල්ඇන්ද.
උපන් දිනය -1941.01.12
දු. අං. 0766259543

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කෝට්ඨාසයේ දොරවක ගම්පියසේ උපන් ජාලත් පේඩිගේ සිරිසේන කලාකරු කැටයම් කලාවේ නියලෙන්නෙකි. කෑ/වර/ ගනේගම කණිටු විදුහලෙන් පාසල් අධ්‍යාපනය ලැබූ මේ කලාකරු බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයෙන් පිරිනමන ශ්‍රී විභූෂණ විශ්වකීර්ති ජනාභිනන්දන සම්මානයෙන් ඇගයීමට ලක්ව තිබේ.

ඩබ්. ඩී. චාන්දනී ජයනෙත්ති

ඒ. 149/1, හරංකහවත්ත, මංගෙදර,
වරකාපොල.
උපන් දිනය- 1978.03.01
දු.අං.0771391357
0703855672

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ මංගෙදර ගම්පියසේ උපන් වර්ෂමාන දේවගේ චාන්දනී ජයනෙත්ති කලාකාරිනිය මංගෙදර කණිෂ්ඨ විද්‍යාලයෙන් හා කුරුණෑගල ලක්දාස් මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. කැළණිය විශ්වවිද්‍යාලයේ ප්‍රාසාංගික කලා උපාධිධාරිනියක් වන ඇය ජාතික නැටුම් සංගීත විභාගයෙන්ද සමත් වී තිබේ. දැයේ දු දරුවන්ට නර්තනය උගන්වමින් ජයග්‍රහණ රැසක් අත්කරදීමට කටයුතු කරමින් සිටින ඇය සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ රැකියාවක නිරත වී සිටියි

එම්. ඒ. අශෝකා චාන්දනී මදුරුසිංහ

තඹදිය, මහපල්ලේගම.
උපන් දිනය- 1968.07.22
දු. අං. 0771715705

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ තඹදිය ගම්පියසේ උපන් මදුරුසිංහ ආරච්චිලාගේ අශෝකා චාන්දනී මදුරුසිංහ කලාකාරිනිය දක්ෂ කිවිඳියකි. හිටිවන කවි ලිවීමේ නියැලෙන ඇය කෑ/වර/ දැදිගම පැරකුම්බා මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. කලා කටයුතුවල මෙන්ම සමාජ සේවාවන්වලටද දායකත්වය ලබා දෙන ඇය ගම්පහ සිංහල ජාතික කවි පෙරමුණ පිරිනමන කාව්‍ය මණික්‍යාකරණ ජනරංජන සම්මානයද හිමිකරගෙන ඇත.

ජී. කේ. සසිකා විනෝදනී සුභසිංහ

සමාධි කලා නිකේතනය,මහවත්ත,
මැදගම,අල්ගම.
උපන් දිනය - 1990.10.08
දු. අං. 0776051514

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ අඹේපුස්ස ගම්පියසේ උපන් පරණ කපුරාලලාගේ සසිකා විනෝදනී සුභසිංහ කලාකාරිනිය උඩරට පහතරට කලායතන නර්තන ගුරුවරියකි. කෑ/වර/තුල්හිරිය කණිෂ්ඨ විද්‍යාලය, කෑ/වර/අඹේපුස්ස මහා විද්‍යාලය හා අලවිව ජාතික පාසලෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇති ඇය කැළණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිධාරිනියකි. කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් පිරි නමා ඇති 2004 කලාවිභාෂි ප්‍රණාම සම්මානයෙන්ද ඇගයීමට ලක් වී ඇති ඇය කලායතන දු දරුවන්ට පළාත් මට්ටමේ ජයග්‍රහණ රැසක් අත් කර දීමට කටයුතු කර ඇත.

ආර්. එම්. විරාජ් ලංකා රාජපක්ෂ

මහවත්ත,මැදගම,අල්ගම.
උපන් දිනය - 1987.11.02
දු.අං. 0776051514

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ අල්ගම ගම් පියසේ උපන් රාජපක්ෂ මුදියන්සේලාගේ විරාජ් ලංකා රාජපක්ෂ කලාකරු නර්තන හා බෙර වාදන ශිල්පියෙකි. කෑ/-වර/අල්ගම මධ්‍ය මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇති ඔහු නාවික හමුදා සංස්කෘතික වාදක කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස සේවය කරයි.

ආර්.එම්. මනෝජ් ලංකා රාජපක්ෂ,

මහවත්ත,මැදගම,අල්ගම.
උපන් දිනය- 1991. 09.14

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ අල්ගම ගම්පියසේ උපන් රාජපක්ෂ මුදියන්සේලාගේ මනෝජ් ලංකා රාජපක්ෂ කලාකරු නර්තන හා බෙරවාදන ශිල්පියෙකි. ඔහු නාවික හමුදා සංස්කෘතික වාදක කණ්ඩායමේ සේවය කරයි.

එච්. ඒ. සුවිනිතා

දෙල්ගහවත්ත,
මීරිගම පාර(ව), වරකාපොල.
උපන් දිනය- 1962.04.26
දු. අං. 0778787296

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ අල්ගම ගම්පියසේ උපන් හල්විතාන ආරච්චිගේ සුවිනිතා කලාකාරිනිය නාට්‍ය හා ගීත රචනා කටයුතුවල යෙදේ. තෝලංගමුව ඩඩ්ලි සේනානායක මධ්‍ය මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත. ගම්පහ සිංහල ජාතික කවි පෙරමුණ පිරිනමන දේශ හිතෛෂී දේශාභිමානී ජනතා ප්‍රසාදිනී සම්මානයෙන් ඇගයීමට ලක් වී තිබේ.

ජී. ලසන්ත සොම්රුවන් ප්‍රේමචන්ද්‍ර

සී2, නිවටුව,වරකාපොල.
උපන් දිනය -1979.02.04
දු. අං. 0773867967

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ නිවටුව ගම්පියසේ උපන් ගණිතයලාගේ ලසන්ත සොම්රුවන් ප්‍රේමචන්ද්‍ර කලාකරු පාරම්පරික ජ්‍යෝතිවේදියෙකු මෙන්ම ජායාරූප ශිල්පියෙකි. ඔහු තෝලංගමුව මධ්‍ය මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත.

එම්. රණසිංහ

යද්දෙනිමුල්ල,දොරවක.
උපන් දිනය -1958.08.29
දු. අං. 0779401679

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ දොරවක ගම්පියසේ උපන් මුතුනායක රණසිංහ කලාකරු ප්‍රතිභාපූර්ණ නාට්‍ය ශිල්පියෙකි. කලා ක්ෂේත්‍රෙය් විවිධ ඇඟයුම් ලබා ඇත.

ආර්. එම්. සුනිල් විජේතුංග

සී27,නියදුරුපොල.
උපන් දිනය -1958.10.23
දු. අං. 0715322544

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ නියදුරුපොල ගම්පියසේ උපන් රන්මුණිගේ සුනිල් විජේතුංග කලාකරු කවි හා ගීත ගායනයේ යෙදෙන්නෙකි.

ජී. ෂම්මි රොෂාන් මාලින්ද,

නිවටුව, වරකාපොල.
උපන් දිනය -1991.09.08
දු.අං. 0713414144

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ නිවටුව ගම්පියසේ උපන් ගණිතයලාගේ ෂම්මි රොෂාන් මාලින්ද කලාකරු නිවටුව පාරම්පරික ජ්‍යෝතිෂ, බෙරවාදන හා නර්තන කලා පරම්පරාවෙන් පැවත එන්නෙකි. කෑ/වර/ ගාමිණී මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත.

උපදේශකත්වය

වරකාපොල ප්‍රාදේශීය ලේකම් ඒ. එම්. රංගන සජීව
වරකාපොල සහකාර ප්‍රාදේශීය ලේකම් ශෂිකා කෝරළගේ

සංස්කාරක

වලානි ධිවන්ති හේරත්(සංවර්ධන නිලධාරි)

තොරතුරු හා සම්බන්ධීකරණ සහාය

පුෂ්පා විජේතුංග (සංස්කෘතික සංවර්ධන නිලධාරි)
මහේෂ් අමරකෝන් (සංස්කෘතික සංවර්ධන නිලධාරි)
දිනුෂා ආරියරත්න (සංවර්ධන නිලධාරි)
හිරුනි ජයවීර (සංවර්ධන නිලධාරි)
අයෝධ්‍යා උඩුගම (සංවර්ධන නිලධාරි)

සෝදුපත් බැලීම

චතුරි ආරියරත්න (සංවර්ධන නිලධාරි)

පිටු සැකසුම

යසින්ත ප්‍රදීප්මාල් (සංවර්ධන නිලධාරි)
කල්හාර කුමාර (තොරතුරු තාක්ෂණ නිලධාරි)

Media Unit
DS Warakapola